" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000
SLSI SYSTEM CERTIFIED ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-BD/01/FI/03(A)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2020.12.15

බස්නාහිර පළාත් සභාවේ,

සියලුම ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය/ පාලන/ පිරිස් හා පුහුණු/ සැලසුම්/ ඉංජිනේරු),

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

අධිකාරිවල සභාපතිවරුන්,

## 2021 ඇස්තමේන්තු

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාත් සභාවේ හය වන පළාත් සභා නිල කාලය 2019 අප්‍රේල් මස 21 වන දිනෙන් අවසන් වූ බැවින් 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව ගරු ආණ්ඩුකාරවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2021 වර්ෂය වෙනුවෙන් බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ මුදල් වියදම් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන් විසින් අවසරය ලබා දී ඇත. එම අවසරයෙහි සඳහන් ප්‍රතිපාදනවලට අදාළ මුදල්, සභා අරමුදලින් ඉවත් කර ගැනීමට අධිකාරී බලය ලබා දෙන ලියවිලි සඳහා ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2020.12.04 වන දින දී අත්සන් තබා ඇත.

02. මේ අනුව ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා ඇති කාර්යය, සැපයුම් හා සේවාවන් වෙනුවෙන් වියදම් දැරීමේදී ගෙවීම් වවුචර්වල සහ අනෙකුත් ලියකියවිලිවල සඳහන් කළ යුතු අධිකාරී බලය පහත දැක්වෙන පරිදි වේ.

අ. සාමාන්‍ය සේවා සම්බන්ධයෙන් 2021 වර්ෂය සඳහා පළාත් සභා අරමුදලින් මුදල් ඉවත් කර ගැනීමේ අධිකාරී බලය

ආ. ශීර්ෂ 100, 101, 104, 105, 106, 107 හා 108 යටතේ විශේෂ නීති විෂයයන් සම්බන්ධයෙන් 2021 වර්ෂය සඳහා විශේෂ නීති සේවා වෙනුවෙන් පළාත් සභා අරමුදලින් මුදල් ඉවත් කර ගැනීමේ අධිකාරී බලය

ඇ. අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් 2021 වර්ෂය සඳහා අත්තිකාරම් කටයුතු වෙනුවෙන් පළාත් සභා අරමුදලින් මුදල් ඉවත් කර ගැනීමේ අධිකාරී බලය

03. කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් පළාත් ආදායම් රැස් කිරීමේදී හා ප්‍රදාන ලබා ගැනීමේදී ඇතිවිය හැකි අයහපත් තත්ත්වයන්ද සැලකිල්ලට ගෙන අරපිරිමැස්මෙන් කටයුතු කිරීමෙන් සහ නාස්තිය පිටු දැකීමෙන් පළාත් සභා වියදම් පාලනය පිළිබඳ පියවරයන් දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමේ වගකීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා ගණන් දීමේ නිලධාරීන් සතු වන්නේය. ඉහත තත්ත්වයන් යටතේ සලසා ඇති ප්‍රතිපාදන සීමාවන්ද තවදුරටත් පාලනය කිරීම සඳහා සීමා පැනවීමට සිදු විය හැකි බැවින් වඩාත් අරපිරිමැස්මෙන් ස්වකීය ආයතනවල වියදම් කළමනාකරණය කරගැනීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් වර්ෂය මුල සිටම සැලසුම් කළ යුතු අතර ඒ පිළිබඳව නිරන්තරයෙන් සිය අවධානය යොමු කරමින් කටයුතු කළ යුතුය.

04. නව බැරකම්වලට බැඳීමට පෙර පළමු කොට 2021 වර්ෂය සඳහා සම්මත ප්‍රතිපාදනවලින් 2020 වර්ෂය වෙනුවෙන් බේරුම් කිරීමට ඇති බැරකම් බේරා දැමීමට හෝ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කොට තැබීමට කටයුතු කළ යුතුය. 2021 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට ඇතුළත් නොවිය යුතුය.

05. කවර තත්ත්වයක් යටතේ වුවද අනුමත කළ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා කිසියම් වියදමක් දැරීම හෝ බැඳීම්වලට එළඹීම හෝ නොකළ යුතුය. ඒ අනුව වර්ෂයේ වියදම් පාලනය කිරීමටත්, මාසිකව සමාලෝචනය කිරීමටත් ගණන් දීමේ නිලධාරීන් විසින් අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. අත්තිකාරම් ගිණුම් කටයුතු ද අනුමත කල සීමාවන් තුල කළමනාකරණය කළ යුතුය.

06. ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කරන ලද 2021 වර්ෂය වෙනුවෙන් බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ මුදල් වියදම් කිරීම සඳහා වන අවසරයෙහි පිටපතක් මීට යා කර එවන අතර ඊට අදාළ 2021 මුදල් ප්‍රකාශ පිටපත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අයවැය අංශයට පැමිණ ලබා ගන්නා ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත:- 01. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.
02. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) - කරු. දැ.ගැ.ස.
03. අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) - කරු. දැ.ගැ.ස.